


# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන

16 වැනි කාණ්ඩය

ඔක්තෝබර් 2021


01 2022 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට

10 සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ එකඟතාව

06 ලංකාගම ප්‍රදේශයේ සංචාරක කටයුතු විධිමත්ව කළමනාකරණය කිරීමට අවධානය

16 නවවැනි පාර්ලිමේන්තුවේ පළමු වැනි සභාවාරය සඳහා වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව පාර්ලිමේන්තුවට



සන්නිවේදන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව




# 2022 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට

**2022 වසර සදහා වන විසර්ජන පනත් කෙටුම්පත පසුගියදා (07) පෙරවරුවේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි.**

2022 මුදල් වර්ෂයට අදාළ සේවා වියදම් ඒකාබද්ධ අරමුදලින් හෝ ප්‍රතිපාදන සහිත වෙනත් සුදුසු අරමුදලකින් ලබා ගැනීමටත්, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව ණය ලබාගැනීම ඇතුළු කරුණු කාරණා සඳහා වන මෙම විසර්ජන පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් 29 දින ගැසට් පත්‍රයේ පළ කිරීම සිදුවිය.

මේ අනුව 2022 ජනවාරි මස පළමු වැනිදා සිට 2022 දෙසැම්බර් 31 වනදා දක්වා වන කාලසීමාව තුළ සේවා වියදම් සඳහා රුපියල් දෙදහස් පස් බිලියන තුන්සිය හතළිස් හය මිලියන පන්සිය පනස් අටදහසක් වන ආණ්ඩුවේ වියදම්වලට අදාල පුනරාවර්තන සහ මූලධන වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

මේ අනුව පනත් කෙටුම්පත පළමු වර කියැවීම අද සිදුවූ අතර දෙවැනි වර කියවීම හෙවත් ගරු මුදල් අමාත්‍යවරයා විසින් අයවැය කථාව ඉදිරිපත් කිරීම, දෙවැනි වර සහ තෙවැනිවර කියැවීමේ විවාද සහ ඊට අදාළ ඡන්ද විමසීම් පැවැත්වීමේ දිනයන් ඇතුළු



කටයුතු පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් ඉදිරි දිනකදී තීරණය කෙරෙනු ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ xvii පරිච්ඡේදය අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුවන අතර බදු නියම කිරීම, ඒකාබද්ධ අරමුදලින් හෝ ප්‍රතිපාදන සහිත වෙනත් සුදුසු අරමුදලකින් ලබා ගැනීම ඇතුළු කාරණා සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගතයුතු වේ.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව දින 26කට නොවැඩි දින ගණනක් විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා වෙන් කෙරේ. එසේම දෙවැනි වර කියැවීම සඳහා දින 07කට නොවැඩි කාලයක් ද වෙන්කරනු ලැබේ.

# ආසියානු කලාපීය නියෝජිතයා වශයෙන් ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා සහභාගී වූ පොදු රාජ්‍ය මණ්ඩලයීය විධායක කමිටු රැස්වීම් මාලාව සාර්ථකව අවසන් වෙයි



**ආසියානු කලාපීය නියෝජිතයා වශයෙන් ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා සහභාගී වූ පොදු රාජ්‍ය මණ්ඩලයීය විධායක කමිටු තෙදින රැස්වීම් මාලාව පසුගිය 30 වැනි දින සාර්ථකව අවසන් විණි.**

පසුගිය 28, 29 සහ 30 යන තෙදින වීඩියෝ තාක්ෂණය ඔස්සේ පැවැත්වූ මෙම පොදු රාජ්‍ය මණ්ඩලයීය විධායක කමිටු රැස්වීම් මාලාවට අප්‍රිකාව, ආසියාව, ඕස්ට්‍රේලියාව, බ්‍රිතාන්‍ය දූපත් සහ මධ්‍යධරණී ප්‍රදේශය, කැනඩාව, කැරිබියන් දූපත්, ඇමරිකාව සහ අත්ලාන්තික්, ඉන්දියාව, පැසිෆික් සහ අග්නිදිග ආසියාව යන කලාප නියෝජනය කරමින් සාමාජිකයෝ සහභාගී වූහ.

ඒ අනුව, ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන සැප්තැම්බර් 29 වැනිදා සැලසුම් සහ සමාලෝචන අනුකමිටුව සමඟ සාකච්ඡා කළ අතර එහිදී කමිටුවේ සාමාජිකයෝ පොදුරාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමයේ මූලස්ථාන ලේකම් කාර්යාල අනුකමිටුව මීට පෙර ගත් තීරණ ක්‍රියාවට නැංවීමට අදාළ කරුණු පිළිබඳව සොයා බැලූහ.

කලාපීය රටවල යහපාලනය ඇතුළු කාරණා ප්‍රවර්ධනය කිරීම සහ යහභාවිතාවන් හඳුනා ගැනීමත් එය දිරි ගැන්වීමක් ලෙස 'වසරේ පොදුරාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සම්මානය' පිරිනැමීමේ යෝජනාව පිළිබඳවත් මෙම කමිටු රැස්වීමේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි.

තවද, පොදුරාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමයේ ආදි සාමාජික සංසදයක් පිහිටුවීම සඳහා යෝජනාවක් ද මෙහිදී අනුකමිටුව වෙත ඉදිරිපත් විය. පොදුරාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමයේ මහලේකම්වරයා මේ පිළිබඳ සාමාජිකයන් දැනුවත් කළ අතර අත්දැකීම් බහුල උපදේශකයින්ගේ මඟ පෙන්වීම නව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වැදගත් බව පෙන්වා දෙමින් අනුකමිටුව ඊට අනුමැතිය ලබා දුන්නේය.

මේ අතර 2022 වර්ෂය සඳහා වූ වසර මැද විධායක කමිටු රැස්වීම් ඉන්දියාවේ ඇසෑම්හිදී පැවැත්වීමට නියමිත අතර 65 වැනි පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සමුළුව 2022 අගෝස්තු 20 සිට 26 දක්වා කැනඩාවේ හැලිෆැක්ස් හිදී පැවැත්වීමට ද නියමිතය.



**පුවත්**

# ශ්‍රී ලංකාවේ ප්‍රජා විශෝධන වාර්තාවේ කෙටුම්පත මහජන යෝජනා සඳහා විවෘත කෙරේ



**ශ්‍රී ලංකාවේ ප්‍රජා විශෝධන වාර්තාවේ කෙටුම්පත මහජන යෝජනා සඳහා විවෘත කරන බව ගරු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතීඥ මොහොමඩ් අලි සබ්රි මහතා පැවසීය. මේ අනුව මෙම වාර්තාව තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණෙන් මහජන අදහස් ලබා ගන්නා ලෙස ඔහු උපදෙස් ලබා දුන්නේය.**

ගරු අමාත්‍යවරයා මෙම උපදෙස් ලබාදුන්නේ අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ගරු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතීඥ මොහොමඩ් අලි සබ්රි මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා(07) පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය. මෙම කාරක සභාවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය සම්බන්ධීකාරක හනා සිංගර් මහත්මිය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නිත්‍ය නියෝජිත රොබර්ට් ජුකාම් මහතා ද සහභාගී වූහ.

පුනරුත්ථාපනය කිරීමකින් තොරව මිනිසුන් සිරගත කිරීම පල රහිත බව තමන් විශ්වාස කරන බවත් ඒ නිසා ප්‍රජා විශෝධනය කිරීමේ ක්‍රමය වඩාත් ඵලදායී ක්‍රමයක් වනු ඇති බවත් මෙහිදී අමාත්‍යවරයා පැවසීය. ඒ අනුව වසර දෙකකට අඩු සිර දඬුවම් නියම වන, සුළු වැරදිකරුවන් බන්ධනාගාර ගත නොකොට ප්‍රජා විශෝධනය කිරීමේ හැකියාව පිළිබඳ සැලකිල්ලට ගැනීම වැදගත් බව හෙතෙම සඳහන් කළේය.

මෙහිදී හිටපු අධිකරණ නිලධාරී, පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා විසින් ප්‍රජා විශෝධනය පිළිබඳ පැහැදිලි කිරීමක් කළ අතර ඔහු සඳහන් කළේ අපරාධ නීතිය සහ යුක්තිය යන සංකල්පයන් එකට බැඳී ඇති බවයි. අපරාධකරුවෙකු ලෙස කෙනෙකු නම් කිරීමට වඩා යහපත් පුද්ගලයෙකු ලෙස සමාජගත කිරීම වැදගත් වන බවත්ය.

එසේම එම අරමුණ අමාත්‍යාංශ උපදේශක කාරක සභාව හරහා ස්තර දෙකක් ඔස්සේ ඉටුකර ගැනීම සිදු කළ හැකි බවද ඔහු සඳහන් කළේය. එනම් දේශපාලන නායකත්වය සහිත දේශපාලන ස්ථරය පළමු ස්තරය බවයි. අදාළ ප්‍රතිසංස්කරණ ඇති කිරීම හා සංවර්ධනය කිරීම සඳහා සිය විශේෂඥතාවයන් උපයෝගී කරගත් විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන නිලධාරීන් සහ වෘත්තිකයින් ඇතුළත් ස්තරය දෙවන කණ්ඩායම බවයි.

මේ අනුව මෙම ක්‍රමය දියුණු කිරීම සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ විවිධ පාර්ශවකරුවන්ගේ යෝජනා අත්‍යවශ්‍ය වන බවද සහකාර මහලේකම්වරයා මෙහිදී පෙන්වා දුන්නේය.

කාරක සභාව ඇමතූ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය සම්බන්ධීකාරක හනා සිංගර් මහත්මිය පැවසුවේ අධිකරණ අමාත්‍යාංශයේ වැඩපිළිවෙල අගය කළ යුතු බවයි. ඇය වැඩිදුරටත් සඳහන් කළේ සුලු වරදකරුවන් බන්ධනාගාරගත වීම අනාරක්ෂිත බවත්  ඒ නිසා සුළු වැරදිකරුවන් ප්‍රචණ්ඩකාරී පුද්ගලයන් වී  බන්ධනාගාරයෙන් පිටතට යාමේ අවධානම් ක්‍රියාවලියක් ඇතිවිය හැකි බවත් ය. මේ නිසාම ප්‍රජා විශෝධනය වැදගත් කාර්යයක් වන

බවත් ඇය වැඩිදුරටත් සඳහන් කළාය.

මෙම කාරක සභාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන වීරසුමන වීරසිංහ, ජී. ජී. පොන්නම්බලම්, සාගර කාරියවසම්, මධුර විතානගේ, ඩයනා ගමගේ, ගාමිණී වලේබොඩ, එස්. කජේන්ද්‍රන්, අජිත් රාජපක්ෂ, අකිල එල්ලාවල යන මහත්වරු සහභාගී වූහ.



පුවත්

# ජයන්ත සුන්දරම් අරුමයිනායහම් මහතා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීමටත්, පී. එස්. එම්. චාල්ස් මහත්මිය මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකාවක ලෙස පත් කිරීමටත් පාර්ලිමේන්තු සභාවේ අනුමැතිය

**වී. සිවඥානසෝති මහතාගේ අභාවය හේතුවෙන් පුරප්පාඩු වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරය සඳහා සුන්දරම් අරුමයිනායහම් මහතා පත් කිරීමට අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කළ යෝජනාවට, ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (25) රැස් වූ පාර්ලිමේන්තු සභාව සිය එකඟතාව පළ කළ බව පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.**

හෙතෙම මීට පෙර විදේශ රැකියා සහ වෙළෙඳපොළ විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේද, ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේද ලේකම්වරයා ලෙස කටයුතු කර ඇත.

ජීවන් ත්‍යාගරාජා මහතා මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇතිවූ පුරප්පාඩුව  සඳහා පී. එස්. එම්. චාල්ස් මහත්මිය පත් කිරීමට ජනාධිපතිතුමා ඉදිරිපත් කර තිබූ යෝජනාවටද පාර්ලිමේන්තු සභාව  එකඟ වී තිබේ. ඇය මීට පෙර උතුරු පළාතේ ආණ්ඩුකාරවරිය ලෙස කටයුතු කළාය. ඇය සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරිය ලෙසත්, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙසත් මීට පෙර කටයුතු කර ඇත.

ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාද, අමාත්‍ය ඩග්ලස් දේවානන්දා මහතාද, පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම් මහතාද මෙම රැස්වීමට එක්වූහ. මෙම රැස්වීම මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්විණ.



# ලංකාගම ප්‍රදේශයේ සංචාරක කටයුතු විධිමත්ව කළමනාකරණය කිරීමට අවධානය



**ලංකාගම ප්‍රදේශයට දේශීය වශයෙන් විශාල සංචාරකයන් ප්‍රමාණයක් මේ වන විට ඇදී එන බවත් එය නිවැරදිව කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම වැදගත් වන බවත් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල මහතා පැවසීය.**

ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ගරු සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (21 ) පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේදී ය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල මහතා සඳහන් කළේ පසුගිය දින කිහිපය තුළ විශාල වශයෙන් දේශීය සංචාරකයින් ලංකාගම ප්‍රදේශය නැරඹීමට පැමිණ ඇති බවයි. මේ නිසා ඉදිරියේදී විදේශීය සංචාරකයන් විශාල ප්‍රමාණයක් මෙම ප්‍රදේශයට ඇදී ඒමට අවස්ථාව ඇති බැවින් මෙසේ පැමිණෙන සංචාරකයින් නිවැරදිව කළමනාකරණය කිරීමේ වැඩපිළිවෙළක් අවශ්‍ය වන බව මන්ත්‍රීවරයා මෙහිදී පෙන්වාදුන්නේය.

එසේම සිංහරාජ වනාන්තරය නැරඹීමට යන විදේශීය සංචාරකයින් ලංකාගම ප්‍රවේශය භාවිත කළ හැකි ආකාරයෙන් අන්තර්ජාල ( Google Map ) තොරතුරු යාවත්කාලීන විය යුතු බවද මන්ත්‍රීවරයා මෙහිදී සඳහන් කළේය. මේ අනුව ඉක්මනින් මේ පිළිබඳ සොයා බලා කටයුතු කරන ලෙස සංචාරක අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මහතා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

එසේම ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක ආශ්‍රිතව සංචාරක කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය වැඩකටයුතු සකස් කිරීම පිළිබඳව ද මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා කෙරුණි.

තවද මහනුවර දිස්ත්‍රික්කය ආශ්‍රිතව සංචාරක කටයුතු වර්ධනය කිරීම සඳහා මහනුවර නගරයේ කේබල් කාර් ව්‍යාපෘතියක් සකස් කිරීම පිළිබඳව ද කාරක සභාවේදී සාකච්ඡා කෙරුණි.

මෙම අමාත්‍යාංශ උපදේශක කාරක සභාවට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන චන්දිම වීරක්කොඩි, වීරසුමන වීරසිංහ, නිපුන රණවක, සම්පත් අතුකෝරල, ගුණතිලක රාජපක්ෂ, වරුණ ලියනගේ, ගීතා කුමාරසිංහ, එස්. එම්. එම්. මුෂාරෆ්, ඩයනා ගමගේ, අමරකීර්ති අතුකෝරල, ජේ. සී. අලවතුවල, ගුණතිලක රාජපක්ෂ, උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ යන මහත්ම මහත්මීහු සහභාගි වූහ.



# අලි වැට සඳහා විදුලිය සැපයීමට අඩු වියදම් දේශීය නිපැයුමක්

**අලි වැට සඳහා විදුලිය සැපයීමට මෙතෙක් භාවිත කළ වියදම් අධික එනර්ජයිසර් උපකරණය ශ්‍රී ලංකාවේ පුද්ගලික සමාගමක් විසින් රුපියල් 76300 කට නිපදවන බව වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී අනාවරණය විය.**

මෙම උපකරණය පිළිබඳව දැනුවත් කිරීම සිදු වුයේ වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ගරු වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍ය සී. බී. රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේ දී පසුගියදා (22) රැස් වූ අවස්ථාවේදී ය.

කාර්මික තාක්ෂණික ආයතනයේ උපදෙස් පරිදි නැනෝ විෂන් අනුරාධපුර පෞද්ගලික සමාගම වෙනුවෙන් මෙම නිෂ්පාදනය හඳුන්වා දෙමින් අදහස් දැක්වූ ජී. වී. කේ.සමරනායක මහතා පැවසුවේ මෙම උපකරණ 400ක් පමණ දැනටමත් අලෙවි කොට ඇති බවයි. එසේම කිලෝමීටර් දහයක පමණ දුරක් මෙම උපකරණය මඟින් ආවරණය කළ හැකි බව ද ඒ මහතා සඳහන් කළේය.

මේ නිසා මෙම උපකරණය භාවිතයට ගැනීමට සඳහා මෙහි තාක්ෂණික නිවැරදිතාවය වැඩි දුරටත් පරීක්ෂාකර බැලීමට කඩිනමින් කටයුතු කරන ලෙස අමාත්‍ය සී. බී. රත්නායක මහතා නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

මීට අමතරව තම්බපණ්ණි රජමහා විහාර භූමිය වෙන් කර ගැනීම සම්බන්ධයෙන්, අම්පාර, මුලතිව්, මන්නාරම, වවුනියාව, මඩකලපුව, ගාල්ල සහ මාතර ප්‍රදේශවල පවතින වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයට අයත් ඉඩම් කිහිපයක ගැටලු පිළිබඳවද මෙහිදී සාකච්ඡා කෙරිණි.

මෙම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීම සඳහා ගරු රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මහතා, ගරු අමාත්‍ය සරත් වීරසේකර මහතා, ගරු රාජ්‍ය අමාත්‍ය චන්න ජයසුමන මහතා සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ඉසුරු දොඩන්ගොඩ, චාල්ස් නිර්මලනාදන්, අකිල එල්ලාවල, චන්දිම වීරක්කොඩි, රෝහණ දිසානායක, අමරකීර්ති අතුකෝරල, එස්.එම්. එම්. මුෂාරෆ්, එස්. රාසමානික්කම්, චින්තක අමල් මායාදුන්න, සිවඥානම් ශ්‍රීතරන් සහ වීරසුමන වීරසිංහ යන මහත්වරු සහභාගි වූහ.





# ශ්‍රී ලංකා ප්‍රංශ පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපති ධූරය අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතාට



**ශ්‍රී ලංකා - ප්‍රංශ පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ අභිනව සභාපතිවරයා ලෙස තරුණ හා ක්‍රීඩා අමාත්‍ය, සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතා පසුගියදා (06) තේරී පත්විය.**

ශ්‍රී ලංකා - ප්‍රංශ පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නව වැනි පාර්ලිමේන්තුවට අදාළ නිලධාරී මඩුල්ල තෝරා පත්කර ගැනීමේ විශේෂ රැස්වීම ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී පැවැත්විණි. ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති එරික් ලැවර්තු මහතා මෙහිදී විශේෂ ආරාධිතයා වශයෙන් එක්වූ අතර පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ද මෙම අවස්ථාවට සහභාගී විය.



මෙහිදී ශ්‍රී ලංකා ප්‍රංශ පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ අභිනව ලේකම්වරයා වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ඉසුරු දොඩම්ගොඩ මහතා ද උප සභාපතිවරුන් වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන වසන්ත යාපාබණ්ඩාර, චාල්ස් නිර්මලනාදන් සහ සෙල්වම් අඩෛක්කලනාදන් යන මහත්වරු ද තේරී පත්වූහ. මීට අමතරව භාණ්ඩාගාරික වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී මේජර් සුදර්ශන දෙනිපිටිය මහතා ද උප ලේකම් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී හෙක්ටර් අප්පුහාමි මහතාද තේරී පත්වූහ.

මෙහිදී අදහස් දැක්වූ ගරු කථානායකවරයා පවසා සිටියේ ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු මෙරට සමඟ විධිමත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා මුලින්ම ඇති කර ගත් යුරෝපීය රටක් ලෙස දීර්ඝ කාලීන ශක්තිමත් සබඳතාවක් දෙරට අතර පවතින බවයි. දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා දෙරටම කැපවී සිටින බවත් කථානායකවරයා පෙන්වා දුන්නේය. එසේම මෙරටට සංවර්ධන ආධාර ලබා දීමේදී ප්‍රංශය දැක්වූ දායකත්වය පිළිබඳ සිය කෘතවේදීත්වය පළ කළ කථානායකවරයා පවසා සිටියේ ප්‍රංශ සංවර්ධන ඒජන්සිය (AFD) මෙරට ව්‍යාපෘති ගණනාවකට දායකත්වය ලබා දී ඇති බවය.

ප්‍රංශය ශ්‍රී ලංකාව සමඟ දීර්ඝ කාලයක් මුළුල්ලේ ශක්තිමත් ද්විපාර්ශවීය සබඳතා පවත්වන රටක් ලෙස ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ව්‍යාපෘති රැසක් සිදුකරන බව පෙන්වා දුන් ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති එරික් ලැවර්තු මහතා ඉදිරියටත් එම සහයෝගීතාව ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටියේය.

මෙහිදී අදහස් දැක්වූ ශ්‍රී ලංකා - ප්‍රංශ පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ අභිනව සභාපති අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතා පවසා සිටියේ ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික යනාදී සෑම අංශයකින්ම ප්‍රංශය සහ ශ්‍රී ලංකාව අතර පවතින මිත්‍රත්වය මෙම සංගමයේ සිය සභාපතීත්වය යටතේ තවදුරටත් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරන බවයි. විශේෂයෙන්ම මෙරටට ප්‍රංශ සංචාරකයන් විශාල වශයෙන් පැමිණෙන බව පෙන්වා දුන් අමාත්‍යවරයා සංචාරක කර්මාන්තය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා - ප්‍රංශ ද්විපාර්ශවීය සබඳතා ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන බවද පැවසීය.

අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ එකඟතාව





**සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත (දෙවැනිවර කියැවීම) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ එකඟතාවය පළ විය. එසේම සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ වන නියෝගයක් ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට එහිදී එකඟතාවය පළ විය.**

මෙම එකඟතාව පළ වූයේ කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ගරු කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ය.

විශේෂයෙන් ඉන්දියාවෙහි සේවයේ නියුක්ත ශ්‍රී ලාංකිකයින් එරට නීතිමය ප්‍රතිපාදන අනුව අනිවාර්යයෙන්ම ඉන්දියානු සමාජ ආරක්ෂණ අරමුදලට දායකත්වය දැක්විය යුතුය. එසේ වුවත් ඔවුන් එරට සේවය නිමවා ආපසු පැමිණීමේදී සමාජ ආරක්ෂණ අරමුදලට දක්වන ලද දායක මුදල් ලබා ගැනීමට නම් වයස අවුරුදු 58ක් සම්පූර්ණ වන තෙක් සිටිය යුතුය.

එහෙත් ලංකාවේ සේවය කරන ඉන්දියානු සේවකයින්ට ඔවුන් නැවත තම මව් රටට යන විට සමාජ ආරක්ෂණ අරමුදල යටතේ ඇති මුදල් ගැනීමේ හැකියාව පවතියි. ඒ සඳහා වයස් සීමාව අදාළ නොවේ. මේ අනුව ඉන්දියාවේ සේවය කරන ශ්‍රී ලාංකේය ශ්‍රමිකයින්ට වයස අවුරුදු 58 ඉක්මවීමට පෙර සමාජ ආරක්ෂණ අරමුදලට දායකත්වය දැක්වූ මුදල් ලබාගැනීමට හැකිවන පරිදි අවශ්‍ය සංශෝධන සිදුකරමින් මෙසේ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත පාර්ලිමේන්තුවට එළඹෙන 07 වෙනි දින ඉදිරිපත් කිරීමට නියමිතව තිබේ.

එසේම සේවක අර්ථසාධක අරමුදලට ලියාපදිංචි කිරීමේ කටයුතු නවීන තාක්ෂණය භාවිතයෙන් සිදු කිරීමට සහ සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ට තම මාසික දායක මුදල් හිණුම්ගත වීම ජංගම දුරකථන කෙටි පණිවිඩ සේවාව ඔස්සේ (SMS) ලබා දීමට හැකිවන පරිදි සකස් කෙරෙන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ නියෝගයක් එදිනම (07) පාර්ලිමේන්තුවට ඉදිරිපත්කිරීමට මෙසේ කාරක සභාවේ එකඟතාවය පළ විය.

තවද 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත යටතේ ගැසට් කර ඇති උපද්‍රවකාරී රැකියා ලැයිස්තු නියෝග සංශෝධනය, පළමුවර කියවීමට අද (04) පාර්ලිමේන්තුවට ඉදිරිපත්කිරීම පිළිබඳ කාරක සභාව දැනුවත් කිරීමද මෙම කාරක සභාවේදී සිදුවිය.

මෙම කාරක සභාවට ගරු රාජ්‍ය අමාත්‍ය ප්‍රියංකර ජයරත්න මහතා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ජෝන් සෙනෙවිරත්න, ගෙවිඳු කුමාරතුංග යන මහත්වරු සහභාගී වූහ.

**පුවත්**

# ප්‍රාදේශීය සභා මට්ටමට විධායක බලතල උපරිම වශයෙන් විමධ්‍යගත කිරීම මෙන්ම කොට්ඨාස මට්ටමින් ජනසභා පිහිටුවීම සඳහා ප්‍රතිපාදන සැලසීම ඉතා වැදගත් බවට ජාතික නිදහස් පෙරමුණ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී යෝජනා කරයි



**සෑම මැතිවරණයකදීම මහජන නියෝජිතයන් තේරීමේදී කොට්ඨාස ක්‍රමය සහ සමානුපාතික ක්‍රමය පිළිවෙළින් 70% සහ 30% ආකාරයට බෙදීයන ක්‍රමවේදය අනුගමනය කිරීම යෝග්‍ය බව ජාතික නිදහස් පෙරමුණ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව හමුවේ සාක්ෂි දෙමින් පසුගියදා (22) පැවසීය.**

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව එහි සභාපති, සභානායක, අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් රැස් වූ අවස්ථාවේ, එම පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රාජ්‍ය අමාත්‍ය ජයන්ත සමරවීර මහතා පැවසුවේ ප්‍රාදේශීය සභා මට්ටමට විධායක බලතල උපරිම වශයෙන් විමධ්‍යගත කිරීම සහ කොට්ඨාස මට්ටමින් ජනසභා පිහිටුවීම සඳහා ප්‍රතිපාදන සැලසීම ඉතා වැදගත් බවයි.

නව ව්‍යවස්ථාව යටතේ පළාත් පාලන මැතිවරණය මඟින් තෝරා පත්කර ගන්නා පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ පළාත් කවුන්සිලය පළාත් සංවර්ධන සභාව බවට පරිවර්තනය කළ යුතුය. එම සභාවලට මහජන පරමාධිපත්‍යයට අදාළ විධායක බලතල පමණක් පැවරීම සුදුසු බවත් ඒ මඟින් පළාත් සභා මැතිවරණය අහෝසි කිරීම සිදු කළ යුතු බවත් ජාතික නිදහස් පෙරමුණ පෙන්වා දුන්නේය.

පළාත් පාලන බල ප්‍රදේශයක ජන සභාවක ඡන්දදායකයින්ගෙන් තුනෙන් දෙකක බහුතර අත්සන් සහිත ඉල්ලීමක් මඟින් අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරයාට ලබාදුන් ජනවරම ආපසු ලබාගැනීම සඳහා සහ අතුරු මැතිවරණ පැවැත්වීම සඳහා ප්‍රතිපාදන සැලසීම සිදුකළ යුතුය. සෑම මහජන නියෝජිතයකු විසින්ම මැතිවරණයට නාම යෝජනා බාරදීමට පෙර මැතිවරණ කොමසාරිස්වරයා වෙත වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු අතර මැතිවරණ කොමසාරිස්වරයා විසින් මැතිවරණයට සති 4කට පෙර එම තොරතුරු ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවත් ජයන්ත සමරවීර මහතා කාරක සභාවේදී යෝජනා කළේය.

මහජන නියෝජිතයකු විසින් මහජනයාට ලබාදෙන පොදු මැතිවරණ පොරොන්දු ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. ඒවා සමාජ ගිවිසුම් ලෙස සැලකීම සඳහා නීතිමය ප්‍රතිපාදන පැනවීම යෝග්‍ය වේ. ඊට අදාළ පැමිණිලි විභාග කිරීම සඳහා විශේෂ විනිසුරු මඩුල්ලක් පත්කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන පැනවීමේ අවශ්‍යතාවද හෙතෙම අවධාරණය කළේය.

පාර්ලිමේන්තු මැතිවරණයකදී ජනතා පරමාධිපත්‍ය විකෘති වීම වැළැක්වීම සඳහා ජාතික ලැයිස්තුව මඟින් පත්කරන මන්ත්‍රීවරුන් ප්‍රමාණය සමස්ත මන්ත්‍රීවරුන්ගෙන් 5% දක්වා අඩු කළ යුතු බවටද එම පෙරමුණ සඳහන් කළේය.

මැතිවරණයේදී වියදම් කිරීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය සහ වැයකරන ආකාරය දැක්වෙන අය වැය සහිත ප්‍රකාශයක් මැතිවරණ කොමසාරිස්වරයාට ලබාදීම සිදු කළ යුතු බවද ඔවුහු යෝජනා කළහ.
ජාතිවාදී සහ ආගම්වාදී නාමකරණය සහිත

පක්ෂ ලියාපදිංචිය අත්හිටුවීම සහ පවතින පක්ෂවල නම් වෙනස් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම, ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය ඡන්ද පත්‍රිකා දෙකක් මඟින් එකම අවස්ථාවක පැවැත්වීම සහ එම මැතිවරණ භාරකාර රජයක් යටතේ පැවැත්වීම, ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු මැතිවරණ සහ ප්‍රාදේශීය සභා සහ සියලුම මැතිවරණ සඳහා මැතිවරණ පැවැත්වීමේ කාලසීමා නීතිය මඟින් පැනවීම සහ දේශපාලන තීන්දු මඟින් ඒවා වෙනස් කිරීමට ඉඩ නොතැබීම පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව හමුවේ ජාතික නිදහස් පෙරමුණ ඉදිරිපත් කළ සෙසු යෝජනා අතර විය.

ජාතික හෙළ උරුමයද පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව හමුවේ සාක්ෂි ලබා දුන් අතර පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන යන පාලන මට්ටම් තුන සඳහාම කේවල සහ සමානුපාත ක්‍රමයට පත්වන මන්ත්‍රීන් සංඛ්‍යාව 60:40 අනුපාතයකින් යුතුව මිශ්‍ර මන්ත්‍රී නියෝජනයක් ලෙස පැවතිය යුතු බව ඔවුහු අවධාරණය කළහ.

පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණය සෑම වසර 4 කට වරක් වසරේ නිශ්චිත වකවානුවක් තුළ එක් දිනයක එකවර පැවැත්වීමටද ජාතික හෙළ උරුමය යෝජනා කළේය.

සෑම මැතිවරණයකදීම අපේක්ෂක ලැයිස්තුවේ සියයට විසි පහක කාන්තා නියෝජනය සහතික කළ යුතු අතර, සමානුපාතික නියෝජනයේදී එකී නියෝජනය තුනෙන් එකක් ලෙස සහතික කළ යුතු බවද එම පක්ෂය කාරක සභාවේදී පෙන්වා දුන්නේය.

මෙම කාරක සභා රැස්වීමට අමාත්‍යවරුන් වන නිමල් සිරිපාල ද සිල්වා, මහාචාර්ය ජී. එල්. පීරිස්, ඩග්ලස් දේවානන්දා, විමල් වීරවංශ යන මහත්වරුද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන රවුෆ් හකීම්, කබීර් හෂීම්, මනෝ ගනේෂන්, මධුර විතානගේ යන මහත්වරුද සහභාගි වූහ.

නීතිපති දෙපාර්තමේන්තුව සහ මැතිවරණ කොමිෂන් සභාව යන ආයතනවල නිලධාරීහුද මේ අවස්ථාවට සහභාගී වූහ.





# කොවිඩ් තත්ත්වය නිසා මේ වසරේ රුපියල් බිලියන 27ක සුරාබදු ආදායමක් රජයට අහිමියි

## *කෝපා කමිටුවේදී අනාවරණය වෙයි*






**පවතින කොවිඩ් තත්ත්වය නිසා මේ වසර තුළදී රුපියල් බිලියන 27 ක සුරාබදු ආදායමක් රජයට අහිමිව ඇති බව සුරාබදු අධ්‍යක්ෂ ජනරාල් එම්. ජේ. ගුණසිරි මහතා පසුගියදා (22) පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී (කෝපා කමිටුවේදී) පැවසීය.**

සුරාබදු දෙපාර්තමේන්තුවේ මේ වසරේ අපේක්ෂිත ආදායම රුපියල් බිලියන 160ක් වුවද පවතින තත්ත්වය හමුවේ ඊට ළඟා වීම අපහසු බවත් සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්වරයා කමිටුවට පෙන්වා දුන්නේය.

ඒ මහතා මේ බව පැවසුවේ සුරාබදු දෙපාර්තමේන්තුවට අදාළව 2019 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව සහ වර්තමාන කාර්ය සාධනය පිළිබඳ විමසා බැලීම සඳහා මහාචාර්ය තිස්ස විතාරණ මහතාගේ ප්‍රධානත්වයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රැස්විය.

සුරාබදු දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව සහ දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව එකිනෙකට සම්බන්ධ වන පරිගණක පද්ධතියක් සැකසීම සම්බන්ධයෙන් 2019 වසරේදී පැවති කෝපා කමිටු රැස්වීමවකදී නිර්දේශ ලබාදී තිබුණද එය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබීම පිළිබඳව කාරක සභාවේදී දීර්ඝ ලෙස සාකච්ඡා විය.

තවද දෙපාර්තමේන්තුවේ සුරාබදු ආදායම ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදි කිරීමට අදාළව පරිඝණක මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව ද කමිටුව අවධාරණය කළ අතර 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය සඳහා අයවැය සහ පරිපූරක මඟින් ප්‍රතිපාදන වෙන් වී තිබුණද එම ව්‍යාපෘතිය නිසි ලෙස ක්‍රියාත්මක වී නොතිබීම පිළිබඳව ද අවධානය මෙහිදී යොමු විය. මේ අනුව දෙපාර්තමේන්තුව අයත් සියලුම ආයතන ඒකාබද්ධ කරමින් ද ඉතා කඩිනමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව කමිටුව පෙන්වා දෙන ලදී.

මේ වන විට පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇති බව සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්වරයා කමිටුවට දන්වා සිටියේය. එහිදී කමිටුව

සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියෝග කර සිටියේ මෙම පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළ කාලරාමුව නිශ්චිත සැලැස්මක් සහිතව නොවැම්බර් 05 වනදාට පෙර කඩිනමින් කෝපා කමිටුවට ඉදිරිපත් කරන ලෙසයි.

රජයේ ආදායම් වර්ධනය කිරීම සඳහා මත්පැන් බෝතල් හා මත්පැන් බෝතල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ආරක්ෂිත ස්ටිකර් සැපයීම හා ආරක්ෂිත ස්ටිකර් කළමණාකරණ පද්ධතියක් සැකසීමේ කටයුතු ප්‍රමාද වීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය. ප්‍රධාන නිෂ්පාදන සමාගම් විසින් ඩිජිටල් තාක්ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පෙන්වා දී තිබීම, පවතින කොවිඩ් තත්ත්වය ඇතුළු කරුණු කාරණා නිසා මෙම ක්‍රියාවලිය ප්‍රමාද වී ඇති බව සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැවසූ අතර මෙම කටයුතු කඩිනම් කරන ලෙස කෝපා කමිටු සභාපතිවරයා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

මෙහිදී අදහස් දක්වමින් රාජ්‍ය අමාත්‍ය ලසන්න අලගියවන්න මහතා පෙන්වා දුන්නේ රජයට තෙවැනි ඉහළම ආදායම ලබා දෙන සුරා බදු දෙපාර්තමේන්තුවට හිමිවිය යුතු නිසි ආදායම ලබා ගැනීමට නම් උක්ත සඳහන් කළ ව්‍යාපෘති කඩිනම් කළ යුතු බවය. මීට පෙර ද කෝපා කමිටුව විසින් ලබාදී ඇති මෙම නිර්දේශ තවදුරටත් ප්‍රමාද නොකොට කඩිනමින් ඉටුකිරීමේ අවශ්‍යතාව කමිටුවේදී දැඩිව අවධාරණය කෙරිණි.

රාජ්‍ය අමාත්‍යවරුන් වන ලසන්ත අලගියවන්න, වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, ප්‍රසන්න රණවීර සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන තිස්ස අත්තනායක, අශෝක් අබේසිංහ, වෛද්‍ය උපුල් ගලප්පත්ති, වීරසුමන වීරසිංහ, ෆයිසාල් කාසිම් සහ බී. වයි. ජී රත්නසේකර යන මහත්ම මහත්මීහු ද මුදල් අමාත්‍යාංශ ලේකම් එස්. ආර්. ආටිගල මහතා සහ සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීහු පිරිසක් ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.

පුවත්

# අමාත්‍යාංශ ලේකම්වරුන් තිදෙනෙකුට සහ තානාපතිවරුන් දෙදෙනෙකුට පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය

**අමාත්‍යාංශ ලේකම්වරුන් තිදෙනෙකුට සහ තානාපතිවරුන් දෙදෙනෙකුට පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය පසුගියදා (22) හිමි වූ බව පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.**

ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් අද පැවති උසස් නිලතල පිළිබඳ කාරක සභාවේදී මෙම අනුමැතිය හිමි විය.

එහිදී රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ජේ. ජේ. රත්නසිරි මහතාට, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය ජේ. එම්. උදිත් කේ. ජයසිංහ මහතා සහ මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් එස්. එම්. පියතිස්ස මහතාට මෙලෙස අනුමැතිය ලබා දී තිබේ.

මෙයට අමතරව ඉතාලි ජනරජයේ නව ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස ජගත් වැල්ලවත්ත මහතා පත්කිරීමට විදේශ අමාත්‍යාංශය ගෙන ඇති තීරණයට පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය හිමි විය. වැල්ලවත්ත මහතා මීට පෙරද ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ධුරය සඳහා නාමයෝජනා අනුමත වී තිබිණි.

ඒ අතරම දැනට නයිජීරියානු ෆෙඩරල් ජනරජයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ධුරය හොබවන ජේ. එම්. ජානක ප්‍රියන්ත බණ්ඩාර මහතා මියන්මාර් මහජන සමූහාණ්ඩුවේ නව ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස පත් කර යැවීමටද අනුමැතිය හිමිවූ බව දසනායක මහතා පැවසීය.

කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම කාරක සභාවේ රැස්වීමට අමාත්‍යවරුන් වන නිමල් සිරිපාල ද සිල්වා, ඩග්ලස් දේවානන්දා, බන්දුල ගුණවර්ධන, රාජ්‍ය අමාත්‍යවරයන් වන වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, විදුර වික්‍රමනායක සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන අනුර ප්‍රියදර්ශන යාපා, විජිත හේරත්, රිෂාඩ් බදියුදීන් සහ තලතා අතුකෝරල යන මහත්ම මහත්මීන් සහභාගී වූහ.

පුවත්

# නවවැනි පාර්ලිමේන්තුවේ පළමු වැනි සභාවාරය සඳහා වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව පාර්ලිමේන්තුවට






**නවවැනි පාර්ලිමේන්තුවේ පළමු වැනි සභාවාරය සඳහා වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණ මහතා විසින් පසුගියදා (06) පෙරවරුවේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 119 ප්‍රකාරව එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණි.**

මෙම වාර්තාවට කාරක සභාව විසින් සිදු කරන ලද විමර්ශන 16ක තොරතුරු ඇතුළත් බව එය ඉදිරිපත් කළ පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණ මහතා කීවේය.

රටේ පොදු ජනතාවගේ විශේෂ සාකච්ඡාවට ලක් වූ මුතුරාජවෙල තෙත් බිම් කලාපයේ වර්තමාන තත්ත්වය සහ අලි මිනිස් ගැටුම වැනි කාලීන ගැටලු පිළිබඳවද මෙම වාර්තාවේ විශේෂ අවධානයක් යොමු කර තිබේ. මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් සැලකිය යුතු කාර්යභාරයක් සිදුකරන ශ්‍රී ලංකා පොලිසියට අවශ්‍ය තාක්ෂණික උපකරණවල පවතින අඩුපාඩු නිසා මාර්ග අනතුරු අඩකින් පමණ අඩුකර ගැනීමට ඇති හැකියාව අහිමිවීම සම්බන්ධයෙන්ද වාර්තාවේ විශේෂ අවධානයක් යොමුව තිබේ.

එමෙන්ම මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව, කොමිෂන් සභාවක් බවට පත් කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතින බවද කාරක සභා වාර්තාව පෙන්වා දෙයි.

අලි මිනිස් ගැටුමට විසඳුම් ලෙස එක් එක් ප්‍රදේශ වලට ගැලපෙන ආකාරයට මිශ්‍ර යෝජනා සහිත මතය අනුගමනය කිරීමේ හැකියාවක් පවතින බවද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ කාරක සභා වර්තාවේ සඳහන් වේ.

වෛද්‍ය පෑට්‍රිරාජ් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කරන ලද ගම වටා වැට ඉදි කිරීමේ ක්‍රමය වියදම් අවම දැනට සාර්ථකත්වයක් ලබා ඇති ක්‍රමයක් බවත්, මෙම වැට නඩත්තුව සඳහා ගම්මුන්ගේ මූල්‍ය දායකත්වය ලබා ගැනීමේ වැදගත්කමක් මෙම වාර්තාවෙන් අවධාරණය කෙරේ.

වාර්ෂිකව රාජ්‍ය ආදායමෙන් සියයට 10ට වැඩි ප්‍රමාණයක් අධ්‍යාපනයට වැය කළද, ඇතැම් පාසල් සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් නොලැබෙන බවද කාරක සභා වාර්තාවෙන් නිරීක්ෂණය කර තිබේ. රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්පත් බෙදී යාමේ දැඩි විෂමතාවක් පවතින බවත්, එම තත්ත්වය ඉවත් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවක් පවතින බවත් කාරක සභා වාර්තාවෙන් පෙන්වා දී ඇත.

නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය සඳහා අවශ්‍ය ගල් අඟුරු ආනයනය කිරීමේදී වැට් බදු අඩුවෙන් ගණනය කර ගෙවා තිබීමට අදාළව සිදු කළ රේගු විමර්ශනයේදී රුපියල් මිලියන 205ක දණ්ඩනයක් පනවා එය අයකර ගෙන තිබීම සම්බන්ධයෙන්ද කාරක සභාව විශේෂ අවධානයක් යොමු කර තිබේ. එහිදී අඩුවෙන් ගණනය කරන ලද වැට් බද්ද අතිරේක

බද්දක් ලෙස අයකිරීම වෙනුවට දණ්ඩනයක් ලෙස අයකිරීම හේතුවෙන් රජයට රුපියල් මිලියන 125.5 ක ආදායමක් අහිමි වී තිබීම සම්බන්ධයෙන්ද කාරක සභා වාර්තාව කරුණු දක්වා තිබේ.

2021 වසරේ මාර්තු මස 30 වැනි දින වන විට(දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ Legacy පද්ධතියට අනුව) හඳුනාගත් ආයතන වලට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලැබිය යුතු හිඟ බදු ප්‍රමාණය රුපියල් බිලියන 18ක් බවද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ කාරක සභා වාර්තාවේ දැක්වේ. මෙම ප්‍රමාණයෙන් මුදලින් අයකර ගෙන තිබුණේ රුපියල් මිලියන 424 ක් පමණි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතියට අනුව එදිනට පැවැති හිඟ බදු ප්‍රමාණය රුපියල් බිලියන 87 කි. මෙම ප්‍රමාණයෙන් මුදලින් අයකර ගෙන තිබුණේ රුපියල් බිලියන 04 ක් පමණක් බවද වාර්තාවේ සඳහන් වේ.

එමෙන්ම විශ්වවිද්‍යාල ශාස්ත්‍ර පීඨවල උපාධිධාරීන්ගේ රැකියා වියුක්තිය ප්‍රමාණාත්මකව වැඩි අගයක් ගන්නා බැවින් මෙය විසඳීම සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළක අවශ්‍යතාවද කාරක සභා වාර්තාවෙන් ඉදිරිපත්කර තිබීම විශේෂත්වයකි.

පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණ මහතා සභාපතිත්වය දරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය 22ක් වෙයි.

**පුවත්**

# පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීමට අදාළ නෛතික සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව නිර්දේශ කරයි

**පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීමට අවශ්‍ය නෛතික සංශෝධන කඩිනමින් සිදුකිරීමට මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව තීරණය කළේය.**



පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව එහි සභාපති, සභානායක, අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (08) රැස්විය.

පළාත් සභා වසර 03 කට අධික කාලයක් අක්‍රීයව පැවතීම හේතුවෙන් මේ වන විට රට තුළ ගැටලු රැසක් නිර්මාණය වී තිබෙන බව මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා කාරක සභාවේදී පෙන්වා දුන්නේය. එක් අයෙකු විසින් පළාත් සභාව පාලනය කරනු ලැබීම සාධාරණ නොවේ. මේ වන විට පළාත් පාලන ආයතන සහ පාර්ලිමේන්තුව සක්‍රීයව පවතී. අක්‍රීයව පවතින්නේ පළාත් සභා පමණි. ඒ හේතුවෙන් පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීම සඳහා ක්‍රියා කළ යුතු බව මුදල් අමාත්‍යවරයා අවධාරණය කළේය.

පවතින තත්ත්වය තුළ පැරණි ඡන්ද ක්‍රමය යටතේ පළාත් සභා මැතිවරණය පැවැත්වීම සඳහා කටයුතු

කළ යුතු බව කාරක සභා සාමාජිකයෝ මෙහිදී පෙන්වා දුන්හ.

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සභාපති, සභානායක, අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා එහිදී පැවසුවේ ලබන වසරේ ජනවාරි මාසයේදී පළාත් සභා මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය නෛතික සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සුදුසු බවයි. එම සංශෝධන සිදු කිරීමේදී සාධාරණ කාන්තා නියෝජනයක් ලැබෙන පරිදි කටයුතු කිරීමේ අවශ්‍යතාවද කාරක සභාවේදී සාකච්ඡා විය.

"බහුතර පිරිසකගේ මතය වන්නේ රටට යෝග්‍ය වන්නේ මිශ්‍ර මැතිවරණ ක්‍රමයක්ය" යන්න කාරක සභාවේ සභාපතිවරයා මෙහිදී කීවේය. කාරක සභාවේදී සාක්ෂි ලබාදුන් බොහෝ දේශපාලන පක්ෂ මෙන්ම ස්වාධීන කණ්ඩායම්ද එම මතයේ සිටින බව හෙතෙම අවධාරණය කළේය.

මැතිවරණ හා ඡන්ද විමසීම් නීති රීතී ප්‍රතිසංස්කරණයට ඉදිරිපත් වූ යෝජනා විශ්ලේෂණය කිරීමේ විද්වත් කමිටුවද පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට සිය යෝජනා ඉදිරිපත් කළේය.

එම කමිටුව වෙනුවෙන් අදහස් දැක්වූ, එහි සභාපති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා පෙන්වා දුන්නේ, පළාත් පාලන ආයතන වල දැනට පවතින මන්ත්‍රීධූර සංඛ්‍යාව අඩුකළ යුතුය යන්න පොදු මහජන මතය බවයි. කොට්ඨාස සංඛ්‍යාව අඩු කිරීමෙන් එය සිදු කිරීම ප්‍රායෝගික නොවන බවත්, මන්ත්‍රීධූර සංඛ්‍යාව අඩුකළ යුත්තේ සමානුපාතික නියෝජනයට වෙන්කළ කොටසින් බවත් ඔහු කාරක සභාවේදී පෙන්වා දුන්නේය. එසේම කොට්ඨාස සහ සමානුපාතික යන කොටස් දෙකෙන්ම එම මන්ත්‍රීධූර සංඛ්‍යාව අඩුකල යුතු බවට විද්වත් කමිටුවේ ඇතැම් සාමාජිකයන් විශ්වාසය පළකරන බවද ඔහු සඳහන් කළේය. කාන්තා නියෝජනය සියයට 25 ක් ලෙස පවත්වා ගැනීම යෝග්‍ය වේ. පාර්ලිමේන්තු සහ පළාත් සභා මැතිවරණ එකම ක්‍රමයක් යටතේ පැවැත්වීම සුදුසුය. පාර්ලිමේන්තු මන්ත්‍රීධූර සංඛ්‍යාව 225 සීමාවේ පවත්වා ගැනීම යෝග්‍ය වෙයි. පාර්ලිමේන්තුවට ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීවරයන් පත් කර ගැනීමට අදාළව නිසි ක්‍රමවේදයක් සැකසිය යුතු බවද මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා කාරක සභාවේදී අවධාරණය කළේය.

මෙම කාරක සභා රැස්වීමට අමාත්‍යවරුන් වන නිමල් සිරිපාල ද සිල්වා, පවිත්‍රාදේවි වන්නිආරච්චි යන මහත්ම මහත්මීන්ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන රංජිත් මද්දුම බණ්ඩාර, අනුර දිසානායක, මනෝ ගනේෂන්, එම්. ඒ. සුමන්තිරන්, මධුර විතානගේ, සාගර කාරියවසම් යන මහත්වරුද සහභාගි වූහ.

නීතිපති දෙපාර්තමේන්තුව, සීමා නිර්ණය කොමිෂන් සභාව යන ආයතනවල නිලධාරීහුද මේ අවස්ථාවට එක්ව සිටියහ.



**පුවත්**

# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2018 වර්ෂයේ පරිගණක මිලදී ගැනීමේදී ඇස්තමේන්තුගත මුදල ඉක්මවා රුපියල් මිලියන 89ක් වියදම් කොට ඇති බව කෝප් කමිටුවේදී අනාවරණය වෙයි





**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2018 වර්ෂයේ පරිගණක මිලදී ගැනීමේදී ඇස්තමේන්තුගත මුදල ඉක්මවා රුපියල් මිලියන 89ක් වියදම් කොට ඇති බව කෝප් කමිටුවේදී අනාවරණය විය.**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව පරිගණක 139 ක් හා ලැප්ටොප් යන්ත්‍ර 74ක් රුපියල් 15,290,000ක ඇස්තමේන්තුගත මුදලකට මිලදී ගැනීමට සැලසුම් කොට තිබුණද, එය ඉක්මවා පරිගණක යන්ත්‍ර මිලදී ගෙන තිබුණි. මේ අනුව පරිගණක යන්ත්‍ර 800ක් හා ලැප්ටොප් යන්ත්‍ර 47ක් රුපියල් 113,303,750ක මුදලකට ප්‍රසම්පාදනය කර තිබුණි. මේ නිසා 2018 වර්ෂයේ පරිගණක මිලදී ගැනීමේදී ඇස්තමේන්තුගත මුදල ඉක්මවා රුපියල් 89,977,500ක මුදලක් ගමනාග මන මණ්ඩලයේ සාමාන්‍ය ගිණුම් හරහා වියදම් කොට ඇති බව මෙසේ කෝප් කමිටුවේදී අනාවරණය විය.

මෙම කරුණු අනාවරණය වූයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ 2017 සහ 2018 වර්ෂ සඳහා වූ විගණකාධිපති වාර්තා සහ එහි වර්තමාන කාර්ය සාධනය පරීක්ෂා කිරීමට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් කොප් කමිටුව පසුගියදා ( 06 ) පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ය.

විශේෂයෙන් මෙහිදී නියමිත ක්‍රමවේදයකින් තොරව මෙසේ මුදල් වියදම් කිරීම පිළිබඳව කෝප් කමිටුවේ සභාපතිවරයා සිය අප්‍රසාදය පළ කළේය. එසේම දුප්පත් අහිංසක ජනතාවට සේවයක් කිරීමට ඇති මෙවැනි ආයතනයක් මෙසේ මුදල් වියදම් කිරීම කිසිසේත් අනුමත කළ නොහැකි බවත් හෙතෙම වැඩිදුරටත් පැවසීය.

එසේම සුඛෝපභෝගී බස්රථ 125 ක් සඳහා කැමරා හා ජී.පී.එස්. ( GPS ) පද්ධති පවත්වාගෙන යාමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ රුපියල් 33,628,840 ක ගිවිසුමකට එළඹ තිබුණි. එහෙත් මෙම උපකරණවලින් කිහිපයක් හැර අනිත් උපකරණ නිවැරදිව ක්‍රියාකාරී මට්ටමේ නොපවතින බව කෝප් කමිටුවේදී අනාවරණය විය. විශේෂයෙන් මෙම බස් රථ වල සේවකයින් මෙම උපකරණවලට හිතාමතාම හානි සිදුකර ඇති බවත් මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරමින් පවතින බවත් මෙහිදී පැමිණ සිටි නිලධාරීහු පැවසූහ. එම පරීක්ෂණය අවසන් වූ වහාම වාර්තාවක් ලබා දීමටත් ඔවුහු පොරොන්දු වූහ. එසේම අදාළ සමාගමේ සේවා කාලය අවසන් වී නොමැති නම් ක්‍රියාකාරී මට්ටමේ නොපවතින එම උපකරණ අදාළ සමාගම මඟින් නැවත පිළිසකර කර ගැනීමට කටයුතු කරන බවත් මෙහිදී එම නිලධාරීහු සඳහන් කළහ.

තවද 2018 දෙසැම්බර් 24 දින ලබාගත් රුපියල් 150,000,000ක බැංකු ණය මුදල, මුදල් අමාත්‍යවරයාගෙන් විමසා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාව මත ලබා ගත යුතු වුවත් එසේ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගැනීම පිළිබඳවද මෙහිදී අවධානය යොමු විය. මෙවැනි ණය ප්‍රමාණයක් නිලධාරීන් කිහිපදෙනෙකුගේ හිතුමතයට ලබාගත නොහැකි බව කෝප් කමිටු සභාපතිවරයා පෙන්වා දුන්නේය. මේ නිසා මේ පිළිබඳව අවශ්‍ය පියවර ඉක්මනින් ගැනීමට කටයුතු කරන ලෙසත් කෝප් කමිටුව මෙහිදී නිර්දේශ කළේය.

එසේම 2017, 2018, 2019, 2020 යන වර්ෂ වලට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට සභාගත නොකිරීම පිළිබඳවද කෝප් කමිටුව පැමිණ සිටි නිලධාරීන්ගෙන් ප්‍රශ්න කළේය. මෙම කාල සීමාව තුළ මුද්‍රණය කිරීම පිළිබඳ යම් ගැටලු තත්ත්වයන් ඇතිවී තිබූ බව මෙහිදී නිලධාරීහු පෙන්වා දුන්හ. කෙසේ නමුත් 2017 සහ 2018 වර්ෂ වල වාර්ෂික වාර්තා මේ වන විටත් අමාත්‍යාංශයට භාර දී ඇති බව මෙහිදී නිලධාරීහු පැවසූහ. මේ අනුව දෙසැම්බර් 31 වෙනි දිනට පෙර මෙම සියලු වාර්තා පාර්ලිමේන්තුවට සභාගත කිරීමට කටයුතු කරන ලෙස කෝප් කමිටුව විසින් මෙහිදී නිර්දේශ කරන ලදි.

2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඉලෙක්ට්‍රොනික් බස් ටිකට් මැෂින් 1000ක් රුපියල් මිලියන 35 ක් වැයකර කර මිලදී ගැනීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියද ලබාගෙන තිබුණි. නමුත් දෙදහස් 2018 වර්ෂයේ දී ඉලෙක්ට්‍රොනික් බස් ටිකට් මැෂින් 2000ක් මිලදී ගැනීමට රුපියල් 75,900,00ක මුදලක් වියදම් කර තිබුණි. මේ අනුව අනුමැතියකින් තොරව ඉලෙක්ට්‍රොනික් බස් ටිකට් මැෂින් 1000ක් මිලදී ගෙන තිබූ අතර, මෙම මිලදී ගත් මැෂින් මගින් අපේක්ෂිත අරමුණු ඉටු නොවීම පිළිබඳවද කාරක සභාවේ අවධානය යොමුවිය. මේ නිසා මාසයක් ඇතුළත මේ පිළිබඳ වාර්තාවක් කෝප් කමිටුවට ලබාදීමට නිර්දේශ කළේය.

එසේම අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරු කිහිපයක ගැටලු පිළිබඳවද, ධාවනයේ පවතින 5921ක බස් රථ සංඛ්‍යාව පිළිබඳවද, දැනට ධාවනයෙන් ඉවත් වී ඇති බස් රථ සංඛ්‍යාව පිළිබඳවද, එසේම වසර 10 ක් පැරණි 2742ක බස් රථ පිළිබඳවද මෙහිදී සාකච්ඡා කෙරුණි.

මෙම කාරක සභා රැස්වීමට ගරු අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ, ගරු රාජ්‍ය අමාත්‍ය ඩී.වී. චානක, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිවරු වන රවුෆ් හකීම්, ජගත් පුෂ්පකුමාර, මධුර විතානගේ, ප්‍රේමිනාත් සී. දොලවත්ත යන මහත්වරු සහභාගී වූහ. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ( ආචාර්ය ) හර්ෂ ද සිල්වා මහතා මාර්ගගත ක්‍රමය ඔස්සේ මෙම කමිටුවට සම්බන්ධ විය. එසේම මේ සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුලු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධාරීන්ද සහභාගී වූ අතර ඇතැම් නිලධාරීහු මාර්ගගත ක්‍රමය ඔස්සේ ද සම්බන්ධ වූහ.




වාර්තා මණ්ඩලය

| | |
|---|---|
| උපදේශනය | ධම්මික දසනායක මහතා (පාර්ලිමේන්තු මහලේකම්) |
| | කුෂානි රෝහණදීර මහත්මිය (නියෝජ්‍ය මහලේකම් හා කාර්ය මණ්ඩල ප්‍රධානී) |
| | ටිකිරි කේ. ජයතිලක මහතා (සහකාර මහලේකම්) |
| සංකල්පය | ශාන් විජේතුංග මහතා |
| ප්‍රධාන සංස්කරණය | බුද්ධිනි රාමනායක |
| | එදිරිවීර ගුණසේකර |
| | නිම්මි හාතියල්දෙණිය |
| ඡායාරූපකරණය | නුවන් දුමින්ද |
| පිටු සැලසුම්කරණය | ඉෂාරා වික්‍රමසිංහ |
| අන්තර්ජාලය හරහා බෙදාහැරීම | ඒ. ජී. එම්. එම්. නුස්කි |

# නිලධර විත්ති



**ගමගේ සරත් කුමාර මයා**

**අධ්‍යක්ෂ - මුදල්**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ඇහැළියගොඩ මධ්‍ය මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ ගමගේ සරත් කුමාර මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී විශේෂ උපාධිය හිමිකරගෙන ඇත.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධියද සම්පූර්ණ කර තිබේ.

සරත් කුමාර මහතා එංගලන්තයේ වරලත් රාජ්‍ය ගණකාධිකාරවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙක් ලෙසද කටයුතු කරයි.

2021 වසරේ ජනවාරි මස 22 වැනිදා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ(මුදල්) තනතුරට පත්වීම් ලබන හෙතෙම, මීට පෙර දීර්ඝ කාලයක් මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙක් ලෙසත්, ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය අධ්‍යක්ෂවරයකු ලෙසද සේවය කර අත්දැකීම් ඇත්තෙකි.



**හසන්ත නලීන් රොද්‍රගෝ මයා**

**ආහාරපාන කළමණාකරු**

**ආහාරපාන හා ගෘහ පාලන දෙපාර්තමේන්තුව**

කොළඹ නාලන්දා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ හසන්ත නලීන් රොද්‍රගෝ මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් සේවා කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් හිමිකරගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා හෝටල් පාසලේද පාඨමාලාවක් හදාරා ඇත.

ඔහු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භෝජනාගාර අංශයේ සහ හොටෙල් ලංකා ඔබරෝයිහි ද ප්‍රායෝගික පුහුණුවක් ලබා තිබේ. භෝජනාගාර සේවකයෙකු ලෙස 1982 වසරේ පෙබරවාරි මස 10 වැනිදා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සේවයට එක්වන හසන්ත නලීන් රොද්‍රගෝ මහතා, මේ වනවිට ආහාරපාන කළමණාකරු ලෙස සේවය කරමින් සිටියි.

හසන්ත නලීන් රොද්‍රගෝ මහතාගේ පාර්ලිමේන්තු සේවා කාලය වසර 40 කට ආසන්නය.

පාර්ලිමේන්තු විත්ති
පුවත් හසුන සඳහා දායක
වීමට ඔබටත් අවස්ථාව...,
"පාර්ලිමේන්තුව" තේමා
කරගත් මාතෘකා ඔස්සේ
ලිපි සම්පාදනයට ඔබටත්
අවස්ථාව පවතී.

සියලු ලිපි සෑම මසකම
15 වැනිදාට පෙර පහත
ඊමේල් ලිපිනයට යොමු
කරන්න.

sriparliament@gmail.com
විමසීම් - 0112 777 328




සන්නිවේදන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100
ෆැක්ස් : +94 11 2777227



ISSN 2806-5425


Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka